# සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය- 2011

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කල මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි සඳහන් නියමයන්ට අනුකූලව පාර්තෝෂිත වෙන්කිරීම සම්බන්ධයෙන් අධිකාරියේ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) වාහන දෙකකට අදාළව වර්ෂයේ ක්ෂය ප්‍රතිපාදනය රු:159,241 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) නිලධරින් 32 දෙනෙකු සඳහා පාර්තෝෂිත දීමනා වෙන්කරීම් රු:296,742 ක් වැඩියෙන් ද නිලධාරීන් 13 දෙනකු සඳහා රු:110,791 ක් අඩුවෙන්ද දක්වා තිබුණි.

#### 1.2.3 නොසැසඳු පාලන ගිණුම්

පහත සඳහන් ගිණුම් ශේෂ ලේඛණ / උපලේඛණ සමඟ නොසැසඳුනි.

| විස්තරය | ගිණුම් අනුව ශේෂය | ලේඛණ / උපලේඛණ අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු: | රු: | රු: |
| ගමන් වියදම් | 1,116,258 | 1,143,421 | 27,163 |
| වෙනත් වියදම් | 1,656,091 | 1,696,634 | 40,543 |

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවස්ථා 07 කට අයත් එකතු වටිනාකම රු:279,005,389 ක්වූ ශේෂයන් පිළිබඳව ලෙජර ගිණුම්, කාර්ය සාධන වාර්තා, භාණ්ඩ ලැබීම් තුන්ඩු යනාදී සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

### 1.2.5 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි වලට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි | | | |
| මු.රෙ. 757 | | | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/ 12 | (i) | 6.5.1 ජේදය | 2011 වර්ෂයට අදාල කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් සමග ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) | 6.5.3 ජේදය | 2009 සහ 2010 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභා ගත කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

මූල්‍ය ප්‍රකාශ වලට අනුව සමාලෝචිත වර්ෂයෙ අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.142,233 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපකව ඉකුත වර්ෂයේ රු.45,870 ක් වූ ඌනතාවය සමග සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.188,103 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුල රජයේ ආධාර රු:5,162,777 කින් ද අධිකාරියේ ආදායම රු.5,393,043 කින්ද වැඩි වීම ඉහත වාසිදායක විචලනයට හේතු වී තිබුණි.

(අ) (i) අධිකාරිය විසින් 2011 වර්ෂය සඳහා සකස් කරන ලද ඇස්තමේන්තු ගත ආදායම හා තථ්‍ය ආදායම සමඟ සැසඳීමේදී අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහක සේවයේ ලියාපදිංචි ගාස්තු රු:209,500 කින්ද බලපත්‍ර ගාස්තු රු:161,000 කින්ද ඉල්ලුම් පත්‍ර ගාස්තු රු:11,000 කින්ද අඩු වී තිබුණි.

(ii) ඇස්තමේන්තු ගත ආදායමට ඇතුලත් වු තෙල් හුවමාරු හා වෙනත් (Bunkering හා Other ( Fine / Penalties ) යන ආදායම් දෙකෙහි තථ්‍ය ආදායම ඉපයීම 100% කින් අඩු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබූ ආදායම රු. මිලියන 9.2 ක් වූ අතර එය මුළු ආදායමෙන් 14.5 % කි. ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබූ ආදායම රුපියල් මිලියන 4.8 ක් වු අතර එය මුළු ආදායමින් 9% ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 ක්‍රියාකාර සැලැස්ම

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියෙ 2011 වර්ෂයේ ක්‍රියාකාර සැලැස්ම අනුව වර්ෂයේ මුළු ප්‍රතිපාදන මුදල රු:35,000,000 ක් වු අතර වර්ෂයේ ප්‍රගති වාර්තා සටහන් වලට අනුව සත්‍ය වියදම රු:25,098,320 ක් විය.ඒ පිළිබඳ විගණනයේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ක්‍රියාකාරකම් 8 ක් සඳහා ප්‍රතිපාදන මුදල ඉක්මවා රු:2,052,230 ක් වියදම් කර තිබුණි.

(ආ) ක්‍රියාකාරකම් 3 ක මුළු ප්‍රතිපාදන මුදල වු රු:1,100,000 ක් ඉතිරි වී තිබුණි.

(ඇ) ක්‍රියාකාරකම් 8ක ප්‍රතිපාදන මුදලින් 50% ක් හෝ ඊට වඩා වැඩියෙන් ඉතිරි වී තිබුණි.මේ සම්බන්ධයෙන සභාපතිවරයා විසින් "2011 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 12.32 මෙම අධිකාරිය වෙත භාණ්ඩාගාරය විසින් නිදහස් කිරීමක් සිදු නොවු බව" දන්වා තිබුණි.

(ඇ) ක්‍රියාකාර සැලැස්ම තුළ වු ක්‍රියාකාරකම් වල වගකීම පවරන ලද නිලධාරීන් නම් කර නොතිබුණි.

(ඉ) ජාත්‍යන්තර සම්මුතීන් අත්සන් කිරීමේ ("Signing International Conventions") ක්‍රියාකාරකම සඳහා 2010 වර්ෂයේ රු:30,000 ක්ද,2011වර්ෂයේ රු:450,000 ක්ද ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් මෙම ක්‍රියාකාරකම වර්ෂ 2 තුළදී ඉටුකර නොතිබුණි.

## 3.2 සේවක වැටුප් ණය

අධිකාරියට ලද ආදායමෙන් රඳවා ගත් මුදල වන රු: මිලියන 6.176 ක මුදලක් යොදවා ආරම්භ කරන ලද සේවකයන් සඳහා වූ වැටුප් ණය / ආපදා ණය යොජනා ක්‍රමය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. 2011 වර්ෂය තුළ රු:4,939,000 ක් ණය ගෙවා තිබූ අතර එක් එක් නිලධාරියාට මාස 12 ක වැටුප, වැටුප් ණය ලෙස ගෙවා තිබුණි.2011 දෙසැම්බර් 31 දිනය වන විට එම අරමුදලින් ගෙවා තිබූ වැටුප් ණය ශේෂය රු: 6,257,776 ක් විය.

## 3.3 ජගත් සාගර දිනය සැමරීම

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් ජගත් සාගර දිනය 2011 ජුනි 08 දින ජෙට්ලයිනර් නෞකාවේදී සැමරීම සඳහා පවත්වන ලද සැමරුම් උළෙල සඳහා අනුමත වැඩසටහන හා මූල්‍ය වියදම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර නොතිබුණි.

මේ සඳහා වර්ෂයේ ක්‍රියාකාර සැලැස්ම මගින් වෙන්කළ මුදල රු: 600,000 ක් වුවත් සත්‍ය වියදම රු:1,234,351 ක් වූ අතර වෙන්කළ මුදල ඉක්මවා රු:634,351 ක් හෙවත් 106% ක් වියදම් කර තිබුණි. මෙම වියදම් දැරීම සඳහා භාණඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

මේ සඳහා මුද්‍රණය කරන ලද සත් සමුදුර සඟරාවේ පිටපත් 1000 ක් සඳහා රු:183,000 ක් 2011 ජුනි 13 දින ගෙවා තිබූ අතර 2011 දෙසැම්බර් 29 වන විටත් බෙදානොහැර ඉතිරි වූ පොත් 165 ක් විය.

## 3.4 ගබඩා පාලනය

මු:රෙ:754 ප්‍රකාරව 2011 වර්ෂය අවසානයේ බඩු ලේඛණ පොත තුලනය කර නොතිබූ අතර වර්ෂය තුළ රු:6,035,071 ක භාණ්ඩ ගබඩාව වෙත ලැබී තිබූ නමුත් භාණ්ඩ ලැබීම් තුන්ඩු නිකුත් කර නොතිබුණි.

## 3.5 නෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

විද්‍යාගාරය සඳහා උපකරණ මිලදීගැනීම් පිළිබඳ නියදියක් පරීක්ෂාවේදී රු: 2,501,100 ක මිළදී ගැනීම් 2010 දෙසැම්බර් මාසය තුළ සිදුකර තිබුණු බව නිරීක්ෂණය වූ අතර එම උපකරණ වර්ෂයක කාලයක් කිසිදු කාර්යයකට උපයෝගී කරනොගෙන නිකරුනේ විද්‍යාගාරය තුළ තැන්පත්කර තිබුණි.තවද විද්‍යාගාරය තුළ පරීක්ෂණ 12 ක් සිදුකිරීමට සැලසුම්කර තිබුණද එම පරීක්ෂණ විගණන

දින වන 2011 දෙසැම්බර් දක්වා සිදුකර නොතිබුණ අතර පරීක්ෂණ සඳහා මිළදිගත් උපකරණ මෙන්ම අමුද්‍රව්‍යද නිෂ්කාර්යව පැවතිබව විගණනයේදී නිරීක්ෂණය විය.

## 3.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් අධිකාරියේ සම්පත්

අංක පී.ඊ.ඩී /12 හා 2003 ජුනි 02 දිනැති භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ 8.3.9 ඡේදයට පටහැනව අධිකාරිය සතු වාහනයක් පරිසර අමාත්‍යංශය වෙත මදා හැර තිබුණද අමාත්‍යංශයේද එම වාහනය නොතිබුණි. එසේ වුවද මෙම වාහනයේ නඩත්තු කටයුතු සඳහා අධිකාරිය විසින් රු:31,184 ක් වැය කර තිබුණි.

## 3.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 143 ක් වූ අතර තනතුරු 03 ක් සඳහා මු:රෙ: 71 යටතේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. තථ්‍ය කාර්ය මණ්ඩලය 107 ක් විය. 2011 වර්ෂයෙදි තනතුරු 36 ක පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු පිරවීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. වර්ෂය තුල නිලධාරීන් 21 දෙනෙක් බඳවාගෙන තිබුණි.

(ආ) 2009 අගෝස්තු 20 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 09/1483/360/049 හි පරිදි වාර්ෂික අළුත් කිරීමට යටත්ව 2009 ඔක්තෝබර් 01 දින සිට 2013 මාර්තු 16 දින දක්වා අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයාගේ සේවය වාර්ෂිකව අළුත් කිරීම සිදුකළ යුතු වුවද එසේකර නොතිබුණි. 2010 ඔක්තෝබර් 01 දින සිට විගණන දිනය වු 2011 දෙසැම්බර් 09 දින දක්වා වසරක කාලයක් සේවය දීර්ඝකිරීමක් නොමැතිව තනතුරෙහි රැඳී සිට වැටුප් වශයෙන් රු:668,310 ක මුදලක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් සභාපතිවරයා විසින් " ලේකම්වරයාගේ ආවරණ අනුමැතිය සඳහා 2012 මැයි මසදී ලිඛිත ඉල්ලීමක් සිදුකර ඇත." යනුවෙන් පිළිතුර ලබාදී තිබුණි.

## 3.8 වාහන උපයෝජනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට ආයතනය සතු වාහන 08 ක් පැවති අතර ඉන් වෙන්කළ වාහන 02 ක් හා සංචිත වාහන 06 ක් ද වශයෙන් විය.වර්ෂය තුළ ඉන්ධන සඳහා රු:817,535 ක් ද, වාහන නඩත්තු වියදම් සඳහා රු.870,474ක්ද, වැයකර තිබු නමුත් ධාවන සටහන් හා ලොග් සටහන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අධිකාරිය සතු එක් වාහනයක් 2007 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවති අතර අළුත්වැඩියා සඳහා 2010 නොවැම්බර් 26 දින රු:865,030 ක මුදලක් වැයකර තිබුණි. අළුත්වැඩියාව නිසි ලෙස සිදුකර ඇති බවට ඉංජිනේරු තහවුරුව ලබාගැනීමක් සිදුකර නොතිබුණි.2012 මැයි 15 දින වන විටත් මෙම වාහනය අළුත්වැඩියාව නිම කර ධාවනයට සුදුසු තත්වයට පත් කර නොතිබුණි. තවද මෙම වාහනයේ ලියාපදිංචි සහතිකය පරීක්ෂා කිරීමේදී එය අමාත්‍යාංශය සතු වාහනයක් බවත්, 2007 මැයි 27 දින අධිකාරිය වෙත පවරා ගෙන අළුත්වැඩියාව සඳහා යොමු කර ඇති බවත් නිරීක්ෂණය විය.

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 ප්‍රසම්පාදන සැලැස්ම

2011 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

2011 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම ඉදිරිපත් කර තිබූ නමුත් ඒ අනුව විගණන කටයුතු කර නොතිබුණි.2011 දෙසැම්බර් 09 දින දක්වා අභ්‍යන්තර විගණනකයකු පත් කර නොතිබූ අතර එක් නිලධරියකු පමණක් වර්ෂය තුළ විගණන අංශයට අනුයුක්ත කර තිබුණි.වර්ෂය තුළ අභ්‍යන්තර විගණන විමසුම් 12ක් නිකුත් කර තිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කල යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) බදුවා ගැනීම්

(ඇ) අයවැය පාලනය

(ඈ) වත්කම් පාලනය